# ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික වෙස් මුහුණු කලාවේ ඉතිහාසය හානිර්මාණ ක්‍රියාවලියපිළිබඳ අධ්‍යයනයක්

එම්.යසින්ත දිල්ෂාන්

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
myasinthadilshan@gmail.com

ප්‍රමුඛ පදඃවෙස් මුහුණු කලාව, ඉතිහාසය,නිර්මාණ ක්‍රියාවලිය

## හැඳින්වීම

ශ්‍රී ලාංකේයජනතාව අතීතයේ පටන් නොයෙක් ඇදහිලි විශ්වාස මත පදනම්ව තම ජීවිතය පවත්වාගෙන යෑමට පුරුදු පුහුණු වී සිටියහ. යාතුකර්ම,බලිතොවිල්, ශාන්තිකර්ම ආදිය පිළිබඳ පැරැන්නන් තුළ පැවතියේ අසීමිත ගෞරවයකි. එපමණක් නොව එම කර්තව්‍යයන් පිළිබඳ ව ඔවුහු දැඩි විශ්වාසයකින් ද යුක්ත වේ. සඳහිරුතරු ස්වභාවික පරිසරය ආදී වස්තූන් මෙන්ම යක්ෂ, දේව, ප්‍රේත ආදී වූ අදෘශ්‍යමාන බලවේගයන්ට ද යටත් වෙමින් තම තීන්දු තිරණ ගැනීමට අතීත ජන සමාජයේ මිනිසුන් අනවින,කොඩිවින හා වස්දොස් දුරලීමට ද රෝගපීඩාදියෙන් වෙන්වීමආදී විවිධ අභිචාර උදෙසා ද වෙස් මුහුණු යොදා ගත්හ. මෙහිදී අධ්‍යයනය කරනු ලබන්නේ ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයක් වශයෙන් වැදගත් වන්නාවූ වෙස් මුහුණු කර්මාන්තයේ ඉතිහාසය මෙන්ම සංස්කෘතිකමය වශයෙන් එහි උපයෝගිතාවය කෙබඳු ආකාර වීද යන්නය.

## පර්යේෂණ ගැටළුව

වෙස් මුහුණු කලාව සිංහල ජනතාවගේ සාම්ප්‍රදායික කලා නිර්මාණයකි. මෙය උඩරට පහතරට සබරගමු අදී නර්තන සම්ප්‍රදායන් සමඟ අත්‍යන්තයෙන්ම බැඳී පවතී.ශ්‍රී ලාංකේය ජන කලාව තුළ වෙස් මුහුණු කලාවට කෙබඳු ස්ථානයක් හිමිවේද? අතීතයේ සිට වර්තමානය දක්වා සමාජ සංවර්ධන ක්‍රියාදාමය තුළ වෙස් මුහුණු කිනම් අවශ්‍යතාවක් සඳහා භාවිත කරන්නට වුවාද යන්න පර්යේෂණ ගැටළුව විය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීම සඳහා සමාජීය විද්‍යා අධ්‍යයනයේ දී යොදාගනු ලබන ගුණාත්මක දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය භාවිත කරන ලදි. එහි දී පළමුවෙන් ම සාහිත්‍යය මූලාශ්‍රය පරිශීලනය කරන ලද අතරශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙස් මුහුණු කලාව පිළිබඳව අධ්‍යයනය කිරීමේදී නිරීක්ෂණය, සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා කේවල අධ්‍යයන ආදී පර්යේෂණ විධි ක්‍රම උපයෝගී කරගන්නා ලදි.

## අරමුණ

ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු කලාවේ ඓතිහාසික තොරතුරු සමාජගත කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.වෙස් මුහුණු කලාවේ ආරම්භය විකාශය සහ නූතන ප්‍රවණතා පිළිබඳ ව අවධානය යොමුකිරීමත් වෙස් මුහුණු කලාවේ උච්චාවචන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සහ ඒ පිළිබඳ සමාජය දැනුවත් කිරීම මෙන්ම වෙස් මුහුණු එදිනෙදා ජන ජීවිතය තුළ කිනම් කර්තව්‍යයන් සඳහා යොදා ගත්තේද යන්න අධ්‍යයනය කිරීමත් මෙහි අභිප්‍රාය විය.

**සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු කලාව තුළින් විවිධ වූ සංස්කෘතිකාංගයන් නිරූපණය වේ. වෙස් මුහුණු කලාවේ ඉතිහාසය පිළිබඳ විමසා බලන විට එය කෙතරම් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියනවාදැයි නිශ්චිතව කිව නොහැකිය. නමුත් වෙස් මුහුණු කලාවේ ඉතිහාසය පිරික්සීමේ දී ජනප්‍රවාදගත තොරතුරු බෙහෙවින් වැදගත් වේ. වෙස් මුහුණු කලාවේ ඉතිහාසය විමසා බලන විට රාවණා චරිතය විශේෂ වේ. රාවණා රජු ලංකා රාජ්‍ය සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ සටන් ක්‍රම භාවිත කළ අතර එහිදී රජුගේ උපක්‍රමයක් වූයේ වෙස් මුහුණු පැළඳ සතුරන් සමඟ සටන් කිරීමයි.ඒ අනුව රාවණා පරම්පරාවේ මුල්ම රජු වන මහා සම්මත රජුගේ කාලයේ වෙස් මුහුණු කලාවේ ආරම්භය සිදුවූ බව සාමාන්‍ය පිළිගැනීම වේ. මහා සම්මත රජුගේ බිරිඳට කෝලම් නාට්‍ය දැකීමේ දොළදුකක් ඇති වූ බවත් එම දොළදුක පිළිබඳ තතු සැලවූ ශක්‍ර දේවේන්ද්‍රයා විශ්මකර්ම දේව පුත්‍රයා ලවා නාට්‍ය හා වෙස් මුහුණු පිළිබඳ ලියන ලද පොතක් රජුගේ උයනෙහි තැබූ බවත් රජු එය ගෙනවිත් නාට්‍යක් රඟ දක්වා බිසවගේ දොළදුක සන්සිඳ වූ බවත් සඳහන් වේ. එතැන් පටන් කෝලම් හා නාට්‍ය කලාව ආරම්භ වූ බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙස් මුහුණු කලාවද ආරම්භ වූ බව ද පුරාවෘත්තාන්තයන්හි කියවේ.

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ලෙස සැලකෙන වැදි ජනතාව සමඟ ද මෙම වෙස් මුහුණු කලාව බැඳී පවතී.ඔවුන්ගේ පූජා කර්ම සිදු කිරීමේ දී ශරීරය සහ මුහුණ පාට කරගත් බව ඉතිහාසය සාක්ෂි දරයි.වෙස් මුහුණු පිළිබඳ මානව විද්‍යාඥයින් කර ඇති පර්යේෂණවලින් පැහැදිලි වන්නේ මෙම විෂය අත්භූත මිත්‍යා ප්‍රබන්ධයන්ගෙන් ගහණය වූ සංකීර්ණ විෂයක් බවයි. ගෞරවණීය ඉතිහාසයකට උරුමකම් හිමි වෙස්මුහුණු කලා නිර්මාණ ක්‍රියාදාමය දෙස අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ කාලයත් සමඟ විවිධ සංවර්ධන අවධි තුළ විවිධ කලාත්මක වෙස් මුහුණු නිර්මාණය වී ඇති බවයි.

ප්‍රාථමික අවධියේ දී වෙස්මුහුණු නිර්මාණය සඳහාගංගා ඉවුරුවල වැවෙන නමැති ශාකයයි භාවිත කරන ලදි.එහෙත් එය කල්පැවැත්මෙන්තොර හෙයින් මඩ සහිත ප්‍රදේශවල වැවෙන සැහැල්ලු සහ කල්පවතින ලී වර්ගවන රුක්අත්තන සහ වෙල්කඳුරු වැනි දැව වර්ගයන් යොදා ගනිමින් වෙස්මුහුණු නිර්මාණය කරන්නට විය. වෙස් මුහුණු නිර්මාණය

- කුට්ටි කිරීම
- දළ ගැසීම
- බර ගැසීම
- ශුද්ධ කිරීම
- වර්ණගැන්වීම

යන අදියර යටතේ සිදු කරනු ලබයි.මුලින්ම වෙස් මුහුණු නිර්මාණය සඳහාඅවශ්‍ය ගස කපා ගන්නේ නැකතකට අනුව ය. එයට අවශ්‍ය පරිදි කොටයක් සකසා ගැනීම "කුට්ටි කිරීම" නම් වේ. පසුව දවස් දෙකක් තුනක් පමණ ගිය පසු මුහුණ කැපීමට අවශ්‍ය ප්‍රමාණයට ලී කොටය කපාගෙන කොට කෑල්ල මට්ටම් කර ගනී. අනතුරුව ලී කොටයේ ඇස්ස කපා ඉවත් කර කොට කැබැල්ල ඔප මට්ටම් කර ගනු ලබන අතරලීයේ ගැට සහිත කොටස් පැතලි කර ගැනීම "දළ ගැසීම" නම් වේ. මෙසේ සකස් කර ගන්නා ලී කොටයේ තමන් නිර්මාණය කිරිමට සූදානම් වන මුහුණේ සැකිල්ල අඟුරුවලින් සටහන් කරනු ලබන අතර පසුව මුහුණේ අවයව මතු කර ගැනීම සිදු කරනු ලබයි.එය "බරගැසීම" නම් වේ. අනතුරුව කෘමින්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා දුමේ දමා දුම් ගැසීම කරණු ලැබේ. එය සති තුනක් පමණ කරණු ලබන අතර පසුව සුමට කිරීම සිළුය "ශුද්ධ කිරීම" නම්

වේ. වෙස්මුහුණු වර්ණ ගැන්වීමේ දී යොදා ගනු ලබන්නේ ස්වභාවික වර්ණ සංයෝගයකි. වෙස් මුහුණු නිර්මාණය කර වර්ණ ගන්වන පුද්ගලයා "සිත්තරේ" යනුවෙන් හැඳින්වේ. පළමුවෙන්ම වෙස් මුහුණට ගල්වන වර්ණය "අල්ලියාදු" ලෙස හැඳින්වේ. එය සකස් කරගන්නේ කිරිමැටි හෝ මකුළුවලින් පෙරා ගැනීමෙනි.කහපාට සාදා ගැනීමට හිරිගල් ද, සාදලිංගම්වලින් රතු වර්ණයද, කොළපොතු ආදියෙන් කොළ වර්ණය හා දම්වර්ණයද සාදා ගනී.සාදා ගත් වර්ණ දොරණ තෙල් භාවිතයෙන් දිය කරගනී. දොරණතෙල් උණු කර දුම්මල සමගමිශ්‍ර කර ආලේප කිරීමෙන් වෙස්මුහුණට දිස් නයක් ලැබේ. වෙස් මුහුණ වර්ණ ගැන්වීමේදී චරිතයේ ස්වභාවය, ස්ත්‍රී පුරුෂ භාවය, දේහ ලක්ෂණ ආදී කරුණු සැලකිල්ලට ගනී. දේව චරිත හා ආධ්‍යාත්මික වශයෙන් ඉහළ චරිත නිරූපණය කරන වෙස් මුහුණුවලට ලා රතු, තැඹිලි, කහ, සුදු වැනි ගෞරව වර්ණ භාවිතා කරයි. උදාහරණ ලෙස රජ මුහුණු, ප්‍රභූන්, ඇමති වැනි චරිත දැක්විය හැකිය. රෞද්‍ර චරිත සඳහා රතු හා දුඹුරු වැනි වර්ණ භාවිත කෙරේ. ගෝත්‍රික මුහුණු වර්ණ ගැන්වීමට නිල් හා තදකොළ වැනි වර්ණ යොදා ගනී.

මෙලෙස සාදා ගනු ලබන වෙස් මුහුණු විවිධාකාර වේ.නාග රාක්ෂ, ගුරුළු රාක්ෂ වැනි වෙස් මුහුණු රාවණා යුගයේදී භාවිත කළා යැයි පැවසෙන්නේ ගෝත්‍රික යුද පිටියේදී සතුරන් බිය වැද්දීමසඳහා ය. ඉතා විශාල යක්ෂ රාක්ෂ මුහුණු පැළඳ සටන් වැදීමෙන් සතුරන් මේ සටන්වදින්නේ මිනිසුන් නොව භයානයක සත්වයන් කියා රැවටෙන්නේ ය.

**සමාලෝචනය**

වෙස් මුහුණු කලාවේ ඉතිහාසය නිශ්චිතව කිව නොහැකි වුවත් ජනප්‍රවාදය අනුව එය රාවණා රාජ්‍ය සමය දක්වා දිව යයි. එතැන් පටන් අනාදිමත් කාලයක සිට මිනිසා වෙස් මුහුණ යොදා ගෙන තිබේ. විශේෂයෙන්ම ශාන්ති කර්ම සහ නර්තනාංගයන් උදෙසා ද විවිධාකාර වෙස් මුහුණු භාවිත කරන බව කිව හැකි ය. මෙම වෙස් මුහුණු කලාව සබැඳි මිත්‍යා විශ්වාස ද පවතී. කෙසේ නමුත් මිනිසාට මානසික තෘප්තියක් ලබා දෙන කලාත්මක නිර්මාණයක් වශයෙන් ද වෙස් මුහුණ අගය කල හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ගුණතිලක, එම්.එච්. (2007)***කෝලම් නාටක සහ ලංකාවේ වෙස් මුහුණ.*** කොළඹ 10: රත්න පොත් ප්‍රකාශකයෝ.